# පර්සියානු සාහිත්‍යය



විශ්ව සාහිත්‍යය තුළ පර්සියානු සාහිත්‍යය වසර දෙදහස් පන්සියයකටත් එපිට අතීතයකට විහිද යන්නක් බවට පිළිගත් මතයක් පවතී. ඉස්ලාම් යුගයක ඇරඹුමත් සමගම ඉන් පෙර යුගවලින් පැවත හා බොහොමයක් සාහිත්‍ය හා කලා නිර්මාණ විනාශව ලොවින් තුරන්ව ගොස් තිබෙන බවද පර්යේෂණවලින් හෙළිවී තිබේ. අදටත් ඒ සමහර කලා නිර්මාණයන්හි සුන්බුන් ඉතිහාසයේ පර්සියානු භාෂාව භාවිතා කළායැයි පැවසෙන කළාපයන් වන ඉරානය, ඉරාකය හා යුරෝපයත් ආසියාවත් අතර ඇති කොකේසස් තීරය ඇතුලත් වර්තමාන පර්සියාවේ දක්නට ඇත.

පර්සියානුවන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ ජලාල්-අද්-දින් මොහමද් රූමි නැතහොත් රූමි නම් මහා කවියා සිය නිර්මාණකරණයේ යෙදුනේ පර්සියන් බසිනි. උතුරු ඇෆ්ගනිස්තානයේ ඓතිහාසික නගරයක් වන බාක් හි උපන් ඔහු මධ්‍යම ඇනටෝලියා කළාපයේ කොන්යා නම් පෙදෙසක දිවි ගෙවමින් නිර්මාණකරණයේ යෙදුනු අතර පසු කාලීනව සෙල්ජුක් අධිරාජ්‍යයේ අගනුවරට සංක්‍රමණය වූ බව සඳහන් වේ.

ගැස්නවික් මුස්ලිමානු රාජ වාංශිකයින් දකුණු ආසියාතික කලාපයෙන් සැලකියයුතු කොටසක් ආක්‍රමණය කර පර්සියාව ඔවුන්ගෙ ආගමික මූලස්ථානය කොට ගත් පසු ඉරානයේද,




මෙසපොතේමියාවේද, අසර්බයිජානයේද, කෝකස් තීරයේද, තුර්කියේ බටහිර පකිස්තානයේද, ටජිකි ස්තානය සහ මධ්‍යම ආසියාවේ තවත් ප්‍රදේශවලද පර්සියානු සාහිත්‍යය පැතිරී යන්නට විය. කරුණු එසේ වුවද අරාබි බසින් හා තුර්කි බසින් සාහිත්‍ය නිර්මාණ කළ පර්සියන් සාහිත්‍යධරයෝද වූහ. ක්‍රිස්තු පූර්ව 522 දී පමණ සිට ක්‍රිස්තු වර්ෂ 750 පමණ දක්වා කාලය තුල, පුරාතන සහ මධ්‍යතන පර්සියානු සාහිත්‍යය නොකඩවා විසිරී පැතිරෙමින් විශිෂ්ටතම සාහිත්‍යය නිර්මාණ රැසක් ලෝකයට දායාද කරන ලදී. පර්සියානුවන් උසස් ඉස්ලාම් සංස්කෘතියක නිර්මාතෘන් වෙමින් සිටි එම යුගයේ පර්සියානු කවින්ද භාෂාව හා පරිසරය ආශ්‍රිතව සොඳුරු දේශපාලනික කතිකාවන් නිර්මාණ තුලින් ඉදිරිපත් කරන්නට පෙළඹී තිබුනු බවක් මූලාශවලින් පෙනී යයි.

ඊසාන දිග පර්සියාවේ කුරාසොන් සහ මධ්‍යම ආසියාවේ පිහිටි උස්බකිස්තානයේ, ටජිකිස්තානයේ, දකුණු කිර්ජිස්තානයේ සහ නිරිතදිග කසක්ස්තානයේ දේශපාලනික පිබිදීමත් සමගම නව පර්සියානු සාහිත්‍යයේ පිබිදීමක් ඇතිවිය. පර්සියානු හා අරාබි බසින් නිර්මාණකරනයේ යෙදුනු ෆර්ඩෝසි, සාදි, හෆීස්, නිසාමි, රූමි සහ ඔමාර් ඛයියාම්ගේ නිර්මාණ බටහිර සාහිත්‍යයද කලම්බාලූ නිර්මාණයන් සේ ප්‍රකට විය.

### ෆර්ඩෝසි (ක්‍රි.ව. 940 - 1020) - Hakim Abu ʾl-Qasim Ferdowsi Tusi

හකීම් අල්-ගාසිම් ෆර්ඩෝසි ටූසි, ශානමේ (රජුන්ගේ පුස්ථකය) නම් වූ පර්සියානු වීර කාව්‍යය ලියූ පර්සියානු සාහිත්‍යධරයායි. එම ග්‍රන්ථය මෙතෙක් තනි පුද්ගලයකු විසින් ලියැවුනු දිර්ගතම වීර කාව්‍යය ලෙස අදටත් පිළිගැනේ. සමනිද් සහ ගැස්නද් රාජ වංශික සභාවන් ඇසුරින් ශානමේ ලියැවීම සිදුවූ නිසාද ෆර්ඩෝසි ඉරාන සාහිත්‍යතුළද විරාජමාන වන්නට විය.

ක්‍රිස්තුවර්ෂ 940, ඉරාන ජාතික ඉඩම් හිමි රදළ පවුලක උපන් ෆර්ඩෝසි, ක්‍රිස්තු වර්ෂ 977 දී ශානමේ වීර කාව්‍යය ලියන්නට අරමුණු කරගත්තේ සිය සමානයා වන ධකිකී ට එහි ඉතිරිය ලියන්නට පැවරීමේ අරමුණද පෙරදැරිවය. නමුත් ධකිකී වහලෙකු අතින් ඝාතනය වීමෙන් පසු රා වංශිකයි න්ගේ නොමසුරු ආධාරය ලැබීමෙන් ශානමේ නිමවීම ෆර්ඩෝසි අතින්ම සිදුවී තිබේ.

වසර තිහක් තිස්සේ ලියැවුණු ශානමේ සහ එහි නිර්මාණකරුවා වූ ෆර්ඩොසි පිළිබඳ ජනප්‍රවාදවල එන පරිදි, ගාස්නි හි සුල්තාන්වරයා ලියැවෙමින් නිමවන ශානමේ හි සෑම දෙපද කවකටම රන් කැබැල්ල බැගින් ෆර්ඩෝසිට ගෙවීමට පොරොන්දු වී ඇත. කොටස් වශයෙන් රන් අයකිරීම ප්‍රතික්ෂේප කරන ෆර්ඩෝසි, එය තොගයක් ලෙස සම්පූර්ණ කව්‍යයයම ලියැවී අවසන් වූ පසු ගෙවන්නට සුල්තාන්වරයාව එකඟ කරගෙන ඇත. වසර තිහක කාලයක් තුළ ලියා නිමකළ ශානමේ වීර කාව්‍යයට පොරොන්දු පරිදි රන් තොගය ගෙවීමට සුල්තානවරයා සූදානම් වූ විට, ඔහුගේ විශ්-වාසවන්ත රාජාභාණ්ඩාගාරික මහමුද්, ෆර්ඩෝසි මිථ්‍යාලබ්ධිකයෙකු ලෙස අපහාසයට ලක් කොට, රන් වෙනුවට රිදී වලින් පොරොන්දුව ඉටුකර ඇග ස්නානාගාරයක විවේකීව සිටිනතර ලද රිදී දීමනාවෙන් කළකිරුනු ෆර්ඩෝසි එම රිදී ඔහුගේ සේවකයින් හා වහලුන් අතර බෙදා දීමේ හේතුවෙන් මරණ දණ්ඩනයට නියම වී තිබියදී පළාගොස් එතැන් සිට ස්වයං පිටුවහලේ ජීවත් වී ඇත. පසු කාලයකදී නැවතත් රන් ත්‍යාගය පොරොන්දු පරිදි ලබා දෙන බව සැල වී සිය රට බලා එන ෆර්ඩෝසි හෘදයාබාධයකින් මිය යන අතර, රන් කරත්තයට මුණ ගැසෙන්නේ අවමංගල්‍ය පෙරහැරකි.

### රූමී (1207-1273) - Jalal –ad-din Muhammad Balkhi (Rumi)

ජලාල්-උද්දීන් මොහොමඩ් නම් වුද රූමී නමින් ප්‍රකට වුද ඔහු 13 වන සියවසේ කවියෙකි. නීතිවේදියෙකි. දේවධර්මධාරියෙකි. මුනිවරයෙකි. රූමී සිය ලේඛන කාර්යයන්හි නියැලුනේ පර්සියානු බසිනි. ඔහු විසින් ලියන ලද දීර්ඝ න්‍යාය ධර්මානුකූල කාව්‍ය සංග්‍රහයක් වන "මත්නාවී" (මස්නාවි) අදටත් පර්සියානු සාහිත්‍ය තුල අති උසස් කලා නිර්මාණයක් ලෙස පිළිගැනේ. මස්නාවි ඉස්ලාම් ධර්මයෙහි එන සුෆී නියාම ධර්ම තුළින් දෙවියන් හා බැඳෙන්නට ජීවිතය හැඩගස්වන, වෙළුම් සයකින් සමන්විත අති දීර්ඝ වූ කාව්‍ය සංග්‍රහයකි. ලොව පර්සියානු බස පරිහරණයවන රටවල අදටත් රූමිගේ නිර්මාණ විශාල වශයෙන් පරිශීලනය වන අතර, බොහෝමයක් නිර්මාණ විදෙස් භාෂාවන්ටද පරිවර්ථනය වී ඇත. තුර්කිය අසර්බයිජානය එක්සත් ජනපදය හා දකුණු ආසියාතික රටවල් රූමිගේ නිර්මාණ අගයන විදෙස් රටයල් ලෙස සැලකිය හැකිය. සිය බොහෙ-ාමයක් කාව්‍ය නිර්මාණයන් සඳහා රූමි ශ්ලොක් සහ ගසල් කාව්‍ය ශෛලීන් යොදාගෙන ඇති අතර ගද්‍ය නිර්මාණ රචනා, ලේඛණ දම අනුශාසනා ආකාරයෙන් ලියවී ඇතිබව පෙනේ.

### Love is the Water of Life

Everything other than love for the most beautiful God
though it be sugar -eating
What of agony of the spirit ?
To advance toward death without seizing hold of the water of life

A moment of happiness,
you and I sitting on the verandah
apparently two, but one in soul, you and I.
We feel the flowing water of life here,
you and I, with the garden's beauty
and the birds singing.
The stars will be watching us,
and we will show them
what it is to be a thin crescent moon.
You and I unselfed, will be together,
indifferent to idle speculation, you and I.
The parrots of heaven will be cracking sugar
as we laugh together, you and I.
In one from upon this earth,
and in another form in a timeless sweet land.

### ජීවයේ දිය ප්‍රේමයයි – රූමි

ප්‍රේමය හැරුණු කොට
අන් සියල්ලම අමාවක්මය
අති සොඳුරු දෙවිඳුන්ට
දොරටුවට මරණයේ
බැදුම් නැති ගමන් යද්දී
දෙයක් වෙද වෙන ආත්මය
දවනා
ජීවයේ ඒ දියම මිස දරනා ?

රැඳෙන ආලින්දයකි
සොඳුරු මොහොතකි
දෙදෙනෙකි, තනි ආත්මයකි
ඔබ මම.
උද්‍යාන සුවයකි
කුරුලු ගී ගොමුවකි
ගලා යන ජීවිතේ නදියකි
ඒ විඳින දෙදෙනෙකි
ඔබ මම.
බලන තරු වියනකි
කෙසඟ අඩසඳක් වීමම
කෙබඳුදැයි කියාදෙන
දෙදෙනෙකි
ඔබ මම,
එක්ව, අනාත්මව,
සමපේක්ෂණයට උදාසීනව
ඔබ මම.
අමා බිඳු බිඳිනු ඇත
දිව්‍යමය ගිරවුන්
එක්ව හිනැහෙනු අස - අසා
ඔබ මම.
එක් අයුරකින් මිහිමත
එහෙත්
කාලයක් අවකාශයක් නැති
කොහේදෝ අන් පින් බිමන් මත
වෙනත් වෙසකින්
ඔබ මම.

පරිවර්තනය:
දිලිනි ඊරියවල

LA TROBE TAXATION SERVICES
LTS LA TROBE TAXATION SERVICES
Your friendly tax accountants


La Trobe Taxation Services is in operation since 2001 and provide taxation services to businesses and individuals. Our areas of specialisation are individual tax returns, business tax returns, investment properties, GST, BAS, IAS, PAYG and registering of ABR. Whenever you have tax related issues we are here to assist you as possible as we could. Our fees are very reasonable and competitive.

La Trobe Taxation Services
Registered Tax Agent
(ABN 67 251 931 300)
CONTACT
Bundoora:
Mala: - 0401000421 or 03-94708241
Cranbourne:
Janaka:- 0403728635 or 03-87868033
Email: latrobetax@yahoo.com.au